www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඓතිහාසික පරිහානිය සහ සමාජවාදය සඳහා ඇති අවකාශ

## The historic decline of US imperialism and the prospects for socialism

**නික් බීම්ස් විසිනි**

**2005 පෙබරවාරි 02**

### 2 වන කොටස

*ජනවාරි 29-30 සති අන්තයේ දී, සමාජවාදී සමානතා පක්ෂය (සසප) ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවත්වී ය. පහත පල කරන්නේ ඕස්ට්‍රේලියාවේ සසප ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික නික් බීම්ස් ඉදිරිපත් කල ආරම්භක වාර්තාවේ දෙවැනි කොටස යි. ඉතිරි කොටස් ඉදිරියේ දී පල කෙරෙනු ඇත.*

පැහැදිලිව ම ඉදිරිදර්ශනය පිලිබඳව පුලුල් ප්‍රශ්න පැන නගී. අඩු තරමේ පෙනෙන මානයේ අනාගතයක් සඳහා වත් නව සමතුලිතතාවයක්, එනම් පැක්ස් ඇමරිකානාවක් ස්ථාපිත කිරීමේ හැකියාවක් ඇමරිකාවට තිබේ ද, නැත හොත් එවැන්නක් සඳහා ගන්නා ප්‍රයත්නයන් සමාජවාදී වූ ප්‍රතිඵලයක් සඳහා අවශ්‍යතාවය සහ ශක්‍යතාවය මතු කරලන දේශපාලනමය හා මිලිටරිමය ද පවා වන ගැටුම් මාලාවක් මුදා හරිනු ලැබේ ද? විකල්ප ලෙස, ගමන්මාවතේ වෙනසක් ඇති කර ලීමට සහ අනෙකුත් ප්‍රධාන ධනපති බලවේග සමග සහයෝගයෙන් දේශපාලන සහ ආර්ථික සමතුලිතතාවයක් ස්ථාපිත කර ගැනීමට ඇමරිකානු ධනේශ්වරය තුලින් වෙනත් බලවේග මතු වී ඒද?

මෙම ගැටලු පරීක්ෂා කරලීම සඳහා මෙම වසර මුල දී පැවැත්වුන වැදගත් සාකච්ඡාවක් දෙසට යලි හැරීමට මට අවසර දෙන්න. ජනවාරි 6දා නව ඇමරිකානු පදනම නම් වූ සංවිධානයක් ''2005 සහ ඉන් ඔබ්බට එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්ති මාර්ග සිතියමක් සැකසුම් කිරීම'' යන විෂයය පිලිබඳව රැස්වීමක් පැවැත් වී ය. ආරාධිත කථිකයන් දෙදෙනා වූයේ ජොෂ්ඨ ජෝර්ජ් බුෂ් ජනාධිපති සහ ජෙරල් ෆෝඩ් යන දෙදෙනාගේ ම ජාතික ආරක්ෂක උපදේශකයා වූ බ්‍රෙන්ට් ස්කොව්ක්‍රොෆ්ට් සහ ජනාධිපති කාටර්ගේ ජාතික ආරක්ෂක උපදේශකයා වූ ස්බිග්නිව් බ්‍රෙසින්ස්කි ය.

ස්කොව්ක්‍රොෆ්ට් සීතල යුද්ධය අවසානයත් සමග ඇතිවුන ''අති මූලික'' වෙනස්කම් පිලිබඳව සඳහන් කරමින් කථාව ඇරඹී ය. රෝම අධිරාජ්‍යයෙන් අනතුරුව, වෙනත් ඕනෑම ජාතියක් සතු බලය ඉක්මවන බලයක් සහිත තත්වයක් ඇමරිකාවට තිබුනි. කෙසේ වෙතත්, සෙසු ලෝකය තමන්ට එරෙහිව කල්ලි ගැසී ඒමේ තර්ජනයට එය මුහුන දී සිටියේ ය.

දෙවන ප්‍රධාන වෙනස ගෝලීය කරනය වන අතර, එය එහි ඉතාමත් ම මූලික වූ අදහසින් ගත් කල ලෝකය ක්‍රියාත්මක වන ආකාරය වෙනස් කලේ ය. ''එය ජාතික දේශ සීමාවන්ගේ අති මූලික ඛාදනයක් වූ අතර එනිසා ම ජාතික රාජ්‍යයේ භූමිකාව ද ඛාදනය කර දැමී ය. තමන්ගේ පුරවැසියන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සැලසීම ලෙසින් අර්ථ ගැන්වුන ජාතික රාජ්‍යයක් විසින් සැම විට ම කරනු ලැබූ දේ ඉටුකිරීමට ජාතික රාජ්‍යයට ඇති හැකියාව අහෝසි කරමින්, දේශ සීමා හරහා එහාට මෙහාට ගලමින් පවත්නා ආර්ථික බලවේග, තාක්ෂනික බලවේග, පාරිසරික බලවේග සහ ත්‍රස්තවාදය ද එහි එක් බලයක් ලෙස පවත්නා දේශපාලන බලවේග ආදී නේක වූ බලවේග තිබේ.

''ගෝලීය කරනය සමග අද සිදුවන දේ මම මීට පෙර වූ කාල පරිච්ඡේදයකට, එනම් සංගත සහ විශාල ආර්ථික සංසද එකට එක් වී තමන්ව ම බලාත්මක වීම ආරම්භ කරමින් ශ්‍රමය සමග, පරිසරය සමග සහ වෙනත් ඒහෝ මේ දෙය සමග ආතතීන් සහ ගැටුම් ඇති කල කාර්මීකරනයේ යුගයට සමාන කරමි. රෙගුලාසි පැනවීම -- කම්කරු රෙගුලාසි, වෙලඳ රෙගුලාසි -- ජාතික රාජ්‍යය තමන් ඉදිරිපත්ව ඉටු කල අතර කම්කරු සමිති මතු වී, ධනවාදය සංවර්ධනය වූ නමුත් ඒ සමගම කාල් මාක්ස් ගේ චින්තනය, සමාජවාදය හා අන් එවැනි දේ සමග ධනවාදයේ තරගය ද වැඩුනේ ය.

''කාර්මික යුගයේ දී හොඳ නරක ජාති දෙකෙන් ම සමන්විත සමස්ත ජීවන ක්‍රමයක් මතු වී ආ අතර සෝවියට් කොමියුනිස්ට්වාදය කඩා වැටීමෙන් අපි වඩාත්ම නරක දේවල අවසාන ශ්ලේෂයන් ද තුරන්කර දැමුවෙමු.''

එහෙත් මෙයින් වූයේ නව ගැටලු තොගයක් පිවිසීම පමනක් බව පෙනේ. ස්කොව්ක්‍රොෆ්ට් කියාගෙන ගිය පරිදි: ''මෙම බලවේග සමග කාරනා කටයුතු කිරීමේ මූලික ඒකකය ලෙස ජාතික රාජ්‍යය කාර්මික යුගය කලමනා කරනය කලේ ය. මම හිතනවා අති මූලිකව වෙනස් කම වනුයේ ගෝලීය කරනයේ බොහෝ ගැටලු සමග ජාතික රාජ්‍යයට ගනුදෙනු කල නොහැකි වීම ය. අද දවසේ ගැටලුවලට දවැන්ත සහයෝගීතාවයක් අවශ්‍යවනුයේ ඒවා නෛසර්ගිකව ම දේශ සීමා හරහා සිදුවන දේ වන නිසා ම වන අතර එක්සත් ජනපදය තරම් බලගතු රාජ්‍යයන්ට පවා අන්තරායයන් මතු කරයි.''

මේ කියන්නේ කුමක් දැයි සලකා බලමු. පසුගිය හතලිස් වසර පුරාවට සමස්ත ලෝකයෙන් ම ඉතාම බලගතු රාජ්‍ය තන්ත්‍රයේ සෑම ආකාරයකින් ම වැදගත් වූ පුද්ගලයෙකු වූ ස්කොව්ක්‍රොෆ්ට් ට අනුව ධනේශ්වර පාලනයේ මූලික ඒකකය වන ජාතික රාජ්‍යයට තව දුරටත් ධනපති ක්‍රමයේ නිෂ්පාදනයේ ගෝලීය වර්ධනය මගින් නිපන් ඉතා සංකීර්න ගැටලු විසඳා ලීමට නොහැකි ය. ඔහුගේ පිලිතුර කුමක් ද? ඇමරිකාව සිදුවීගෙන යන දෙය පිලිබඳව ''පය පැටලී'' සහ ''මග වැරදී'', ''ඒකපාර්ශ්වීය'' වූයේ යයි සැලකෙන ප්‍රවනතාවයක ඉලක්කයක් බවට පත් වී ලොව සමහර දෙසින් උද්දච්චයකු ලෙස සැලකුම් ලබන නිසාවෙන් කල යුතුව ඇත්තේ ''සහයෝගී වී සිටින රාජ්‍යයන්ගේ නව ප්‍රතිචාරයන් ලැබ'' ගෝලීය කරනයේ ගැටලු විසඳා ගැනීම යයි පැවසීම හැර වැඩි යමක් නො වේ.

බ්‍රෙසින්ස්කි සිය කරුනු දැක්වීම ආරම්භ කලේ ඉරාක යුද්ධය පිලිබඳව චෝදනා කරමිනි. ඔහු පැවසුවේ එය, ''තෝරාගත් යුද්ධයක් (බ්‍රෙසින්ස්කි මෙම කරුන සඳහන් නො කල ද ඒ අර්ථයෙන් යුද අපරාධයකි.) වන අතර එය ඇරඹුනු ක්‍රමය, යුක්ති යුක්ත කල විධිය සහ යුද්ධය කරගෙන ගිය අයුරු යන අංශවලින් මෙය ඇමරිකාව ලද සදාචාරාත්මක පරාජයකි. එසේම එය දේශපාලනික සහ මිලිටරි පරාජයකි.

ඇමරිකාව දැන් බෙදී ගිය ජාතියක් වන අතර ජාත්‍යන්තර සුජාත භාවය අහිමි කර ගෙන තිබේ. ''ජාත්‍යන්තර එක්සත් බව යලි උදා කර ගැනීම අප සියල්ල මත පැවරුනු වගකීමක් වන නමුත් ජාත්‍යන්තර නීතිය හැඩගස්වන උදවියගේ කර මත එය විශේෂයෙන් පැවරී තිබේ.'' කෙසේ වෙතත් ජාත්‍යන්තර කීර්තිය යලි ලබාගැනීමට ඇමරිකාවට ''දැඩි ලෙස වෙහෙස වීමට'' සිදුව තිබේ. ඉරානය න්‍යෂ්ඨික අවි නිපදවන්නේ යැයි පරිපාලනය පැවසුව හොත් කිසිම කෙනෙක් ඒ වග විශ්වාස නො කරනු ඇත.

දිගු කාලීන මූලෝපායික කාර්යයන් පිලිබඳව යොමුවෙමින් ඔහු මෙසේ පැවසී යඃ ''පුලුල් කාරනා සම්බන්ධයෙන් මම අදහස් කරන්නේ අප ලඟා කර ගත යුතු දේ වනුයේ ගෝලීය ප්‍රශ්න පිලිබඳව ක්‍රියා කිරීමට අව්‍යාජ මහා සන්ධානයක් යලි පිහිටුවීම බව ය. මෙහි අදහස වන්නේ, පුලුල් වෙමින් තිබෙන්නා වූ ද ක්‍රමිකව වඩාත් මූලෝපායික කටයුතුවල යෙදී සිටින්නා වූ ද යුරෝපය සහ ජාත්‍යන්තරව වඩාත් ක්‍රියාශීලී ජපානය සමග වඩා සමීප සබඳතා ඇති කර ගැනීම යි. ...වඩා ස්ථාවර ලෝකයක් නිර්මානය කිරීමේදී ප්‍රතිඵලදායී ගෝලීය හවුල්වීමක් සඳහා ආරම්භක ලක්ෂ්‍යය වනුයේ යුරෝපය සහ ජපානය සමග සබඳතාවය යි. සහභාගි වීමට අන් කිසිවකු සූදානමක් හෝ කැමැත්තක් නැත. ඔවුන්ගේ සහාය අවශ්‍ය වන අතර එය නොතකා හැරිය නොහැකි ජීවිතය පිලිබඳ මූලෝපායික සාධකයකි.''

ඇමරිකාව සිය සතුරන් එක්සත් කිරීම සහ මිතුරන් භේද කිරීම නැවැත්විය යුතු බව ඔහු තරයේ පැවසී ය. සිය කරුනු දැක්වීම්වල අවසාන නිගමනයේ දී බ්‍රෙසින්ස්කි මෙම ඉදිරිදර්ශනයේ පරදුවට තබා ඇත්තේ කුමක්දැයි ඉතා පැහැදිලිව දක්වා සිටියේ ය. ''අලුතින් පිබිදී එන ගෝලීය ජනකාය ලෝක පද්ධතියට ඇතුල් කරගනු සඳහා යුරෝපය හා ජපානය සමග වන මහා සන්ධානයක පදනම මත අපගේ ප්‍රධාන මිතුරන් සමග ඉදිරියට යාම'' අවශ්‍ය ය.

''මෙය ඓතිහාසිකව ඉතාම වැදගත් නව යථාර්ථයකි. අපි ප්‍රථම වතාවට දේශපාලනිකව සංවේදී ලෝක ජනකායක් සිටින ලොවක ජීවත් වෙමු. මෙවැන්නක් මීට පෙර පැවතී නැත. සහතිකෙන් ම මෙම ජනකායයන්ගේ ඉදිරියේ ම, විශාලතම ජනගහනයක් වැලඳගෙන සිටින්නා වූ ද පුදුමාකාර ලෙස බලගතු වූ ද මේ දසවසේ සාර්ථකවූ රාජ්‍යයන් දෙකක් වේ. එනම් චීනය සහ ඉන්දියාව ය. මේ දෙක එක්ව ගත් කල බිලියන තුනකට ආසන්න ජනකායක් වසති. අපට අනාගතයේ දී ලැබෙන පද්ධතියේ ස්වභාවය නිර්නය වනු ඇත්තේ ඔවුන් ජාත්‍යන්තර පද්ධතියට සමෝධානය කරන්නේ කෙසේ ද යන්නෙනි. නම් කර පවසන්නේ නම්, එය සියල්ල ඇතුලත් කරගත් ගෝලීය පද්ධතියක් ද? එසේ නැතහොත් අලුතෙන් පිබිදී ආ දේශපාලන ජනකාය ත්‍රස්තවාදය ද ඇතුලු ප්‍රචන්ඩත්වයට - වාර්ගික, ආගමික, ජාතික - පදනමක් වේද?''

## ලෙනින් සහ කවුට්ස්කි

සත්තකින් ම පෙර කාල පරිච්ඡේදවල සිටි ඔවුන්ගේ සහෘදයන් සේ ම මෙම අලුතින් පිබිදුනු ජනකායයන් සමාජවාදී ඉදිරිදර්ශනයක් සඳහා ගමන් කිරීමට අරඹයිදෝ යන අති විශාල එහෙත් අප්‍රකාශිත භීතිය පසු බිමෙන් පෙනි පෙනී පවතී.

ඇමරිකානු විදේශ පිලිවෙත් කව ඇතුලත සාකච්ඡාවන් පලමුවන ලෝක යුද්ධයේ ඓතිහාසික වැදගත්කම පිලිබඳව ලෙනින් සහ කාල් කවුට්ස්කි අතර ගැටුම සිහියට නංවයි. යුද්ධය පුපුරා යාම ලෝක

ධනවාදී පද්ධතියේ කඩා වැටීම සහ සමාජවාදී විප්ලවයේ විශයබද්ධ අවශ්‍යතාවය සලකුනු කල බව ලෙනින් තරයේ කියා සිටියේ ය. යුද්ධය අධිරාජ්‍යවාදී බලවතුන්ගේ තෝරාගත් පිලිවෙතක් නොව ලෝකය බෙදාගැනීමේ සහ යලි බෙදාගැනීමේ අරගලයක ආරම්භය යි. මෙය ගලා එනුයේ ධනපති නිෂ්පාදන ක්‍රමයේ මූලික ලක්ෂනයන්ගෙන් සහ අධිරාජ්‍යවාදයේ වර්ධනයෙනි. වෙලඳපොල සහ ලාභය සඳහා වන අරගලය එක්තරා අවස්ථාවක දී මිලිටරි අරගලයක් බවට පත්වෙයි. එහෙයින් යුද්ධය අවසන් කිරීමේ එකම මාවත - එසේම යුරෝපා යුද බිමේ මුදා හැර තිබෙන ම්ලේච්ඡත්වය - සමාජවාදී විප්ලවය මගින් ධනවාදය පෙරලා දැමීම ය.

මෙම විශ්ලේෂනයට ද සියල්ලටමත් වඩා ඉන් ඇඟවුම් කරන ඉදිරිදර්ශනයට ද කවුට්ස්කි විරුද්ධ විය: එනම් පක්ෂය සූදානම් වෙමින් සිටි සමාජවාදී විප්ලවය තව දුරටත් දුර අනාගතයේ සිදුවන්නක් නොව පක්ෂ ක්‍රියාමාර්ගයේ පදනම විය යුතු ය යන්නට විරුද්ධ විය. යුද්ධය තුල දී ධනවාදය, පාර-අධිරාජ්‍යවාදී වන වෙනත් අදියරකට, අධිරාජ්‍යවාදීන්ගේ ශුද්ධ සංධානයකට ධනවාදය ඇතුලු වීම සිදු වියහැකි වෙතැයි පැවසූ ඔහු එහිදී ඔවුන් ලෝකය සාමකාමීව බෙදාගැනීමට ගිවිසි ගනු ඇතැයි ද කීය. අධිරාජ්‍යවාදී බලවතුන් අතර ලෝක යුද්ධයේ ප්‍රතිඵලය ''සිය ආයුධ තරගය අතහැර දමන, ශක්තිමත්ම අයගේ සමූහාන්ඩුවක් විය හැකි ය.''

ධනපති බලවතුන් අතර වන ඕනෑම සාමයක් තාවකාලික එකක් වන්නේ යයි තරයේ කියමින් ලෙනින් කවුට්ස්කිට විරුද්ධ විය. එක් කාලවකවානුවක එක්තරා බල තුලනයක් නියෝජනය කරමින් ලඟා කරගන්නා අවබෝධයක් ධනවාදයේ ම අසමාකාර වර්ධනය හේතුවෙන්, නව ගැටුම්වලට තත්වයන් නිර්මානය කරමින් අනිවාර්යයෙන්ම අවුල් වී යන්නේ ය.

මෙම මතභේදයේ ආලෝකය තුල ස්කොව්ක්‍රෝෆ්ට සහ බ්‍රෙසින්ස්කි යන මහත්වරුන්ගේ තර්ක විතර්ක විමසා බැලීම උපදේශාත්මක ය. බුෂ් පරිපාලනයේ අනෙකුත් විවේචකයන් මෙන් මොවුහු ඇමරිකාව ගෝලීය අධිපතිවාදය ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය ප්‍රශ්න නො කරති. නො එකඟතාවය විවර්තනය වන්නේ යොදා ගන්නා විධික්‍රම වටා ය. ඔවුන්ගේ තර්කය වන්නේ ගෝලීය ධනවාදයේ වර්ධනය ම සහ සංකීර්නතාවලින් අදහස් කැරෙනුයේ මෙම අධිපතිභාවය ඒක පාර්ශ්වීය ක්‍රියාමාර්ගවලින් ලඟා කරගත නොහැකි බව ය. මින් සිදුවන්නේ අනෙකුත් ප්‍රධාන බලවතුන් ඇමරිකාවට එරෙහිව යාමේ අනතුර හෝ ඊටත් වඩා බිහිසුනු විය හැකි අලුත් දේශපාලනිකව පිබිදුනු ජනකාය ඇමරිකාවට එරෙහිව අවතීර්න වීමේ අනතුර ය. ඒක පාර්ශ්වීය භාවය මහ බලවතුන්ගේ මහා සන්ධානයකින් විස්ථාපනය කල යුතු ය. මේ 21 වන සියවස සඳහා පාර-අධිරාජ්‍යවාදයේ ක්‍රියා මාර්ගයකි.

කෙසේ වෙතත් මින් අනෙකුත් ගැටලුවක් පැන නගී: පසුගිය වසර 50 තිස්සේ ජාත්‍යන්තර දේශපාලනයට පදනම සකස් කල පැරනි සන්ධාන හා සබඳතා පද්ධතියන් කඩා බිඳ වැටුනේ කුමක් නිසා ද? වෙනත් විධියකින් ප්‍රශ්නය මතු කරන්නේ නම්, පසුගිය 50 වසරේ කවුට්ස්කියානු පාර-අධිරාජ්‍යවාදය ලෙස නම් කල හැකි යුගය නො නැවතී ම අනාගතයට දිව යාද නැත හොත් මෙම ඓතිහාසික යුගයේ ධනවාදයේ ව්‍යාධිය යැයි ලෙනින් කියා සිටි යුද්ධය ද ඇතුලු අන්තර් අධිරාජ්‍යවාදී ගැටුම් යලිදු වතාවක් මතුපිටට ඒමේ මුව විට අප සිටින්නේද?

වර්තමාන විදේශ පිලිවෙත අන්තරායෙන් වෙලී ඇතැයි ඇමරිකානු පාලක කවයන් තුල වැඩෙමින් එන අදහසක් තිබේ. බුෂ් පරිපාලනය සහ ඊනියා නව කොන්සවේටිව්වරු පිලිබඳව විවේචනශීලීවන මෑත පලවූ පොතක මෙම කාරනාව මෙසේ දක්වයි: ''අපගේ විවේචන ගලා එන්නේ 'මධ්‍ය දක්ෂිනාංශයෙන්' වන අතර දෙවන ලෝක යුද්ධයේ සිට විශාල සාර්ථකත්වයකින් යුතුව ඇමරිකානු පාලකයින් විසින් අනුගත කරගන්නා ලද, අවශ්‍යතාවයෙන් මෙහෙයවුන, මත විමසීමෙන් යුතු, අනතුරු පිලිබඳව දැනුවත් ගුනධර්මයන් අත්පත් කර ගනී. ඒවා එක්සත් ජනපද උවමනාවන් පෙරට ගෙන යාමට අතිරේක වේදිකා සහ සන්ධර්භයක් සලසාලන සන්ධාන හා ජාත්‍යන්තර සන්තතීන් නැතිවම බැරි වත්කම් වූ පිලිවෙත් ය. ... නව කොන්සවේටිව්වාදීන් අපේ ජාතියේ අනාගතය සඳහා යෝජනා කරන්නේ පවත්වා ගෙන යා නොහැකි මොඩලයක් බව අපි විශ්වාස කරමු. බූර්බෝන් ගැන ටැලිරන්ඩ් නිරීක්ෂනය මෙන් මොවුන්ගේ මෑත ලියවිලි දක්වන්නේ 2003 ඇෆ්ගනිස්ථානයේ සහ ඉරාකයේ දී ජාතියේ අත්දැකීම් පිලිබඳ සියල්ල ඔවුනට මතක නමුත් ඉන් කිසිම දෙයක් ඉගෙන ගෙන නැති බව යි. අපි 1945 සිට 2000 දක්වා රිපබ්ලිකානු සහ ඩිමොක්‍රැටික් යන දෙකොටසේ ම මාර්ග උපදේශකයා වූ අවශ්‍යතාව ඉලක්ක කර ගත් මැදමාවත් පිලිවෙත් මත පදනම් වූ විකල්පයක් දරා ගෙන සිටින්නෙමු. පරදුවට තබා තිබෙන්නේ **ඕනෑම කෙටිකාලීන වාසියක් අවලංගු කර අහෝසි කර දමන්නා වූ** පෙරලා පහර දීමක් මුදාහරින්නේ නැතිව එක්සත් ජනපදය ස්ථාපිත කලා වූ ලිබරල් ආන්ඩුකරනයේ ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටීන් සහ මූලධර්ම පෙරට ගෙන යාමට එක්සත් ජනපදය සතු හැකියාව ය.'' [ස්ටීවන් හලිෆර් සහ ජොනැතන් ක්ලාර්ක්, *America Alone,* (ඇමරිකාව තනියම)පිටු 7-8, අවධාරනය එකතු කෙරිනි]

එහෙත් 2000 දී පැරනි පද්ධතිය එක්වර ම අවසානයකට පත්වූයේ මක්නිසා ද? එය සරලව

ජනාධිපතිවරනයේ රිපබ්ලිකන් ජයග්‍රහනයේ ප්‍රතිඵලයක් විය නොහැක. එය ඉතිහාසයේ නරක බුෂ් පිලිබඳ න්‍යාය ය. රීගන් සහ තැචර් ඡන්දයෙන් දිනීම මත ''නිදහස් වෙලඳපොල'' ආධිපත්‍යය සහ ජාතික ආර්ථික පරිපාලනය අවසානයකට ඒම පැටවිය නොහැකි සේ ම ඇමරිකානු විදේශ පිලිවතේ හැරීම ද බුෂ් පිට පැටවිය නොහැක.

ඇමරිකානු විදේශ පිලිවෙත හැසිරවීමේ ගුනාත්මක වෙනසක් සිදුව ඇති බව ගැන ප්‍රශ්නයක් නැත. එහෙත් මෙහි මූලාශ්‍රය තිබෙන්නේ බුෂ් පරිපාලනයේ මානසිකත්වයේ හෝ නව කොන්සවේටිව් කුට්ටාලියේ නැග ඒමේ නොව, ඒවා රඳා ඇත්තේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඓතිහාසික වර්ධනය සහ සමස්තයක් ලෙස ලෝක ධනවාදයට එහි ඇති සංකීර්න සබඳතාවය තුල ය. මෙම සබඳතාවය විභාග කිරීම එය පැහැදිලි කරවන අතර අපගේ ම ව්‍යාපාරයේ ඉදිරිදර්ශනයේ අති මූලික කාරනා මතු කරයි.

**මතු සම්බන්ධයි**

© www.wsws.org